**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදි උපාධි පරීක්ෂණය**

**1 වසර (මාගර්ගත) - 2021**

**(පුනර්)**

**අපරාධ නීතිය**

**පැය තුනයි**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: **06**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න

(නොපැහැදිලි අත් අකුරු සඳහා අපේක්ෂකයින්ගේ ලකුණු කෙරේ.)

1. වරදක් කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතිය සහ එංගලන්ත නීතිය යටතේ සේන වරදකරු කළ හැකිද යන්න හේතු දක්වමින් සලකා බලන්න:

(i) දරුවන් පස් දෙනෙකු සමඟ සමාගමයේ යෙදෙමින් සිටි සංගීතඥයෙකු වන සේන, ඔහුගේ නිවසේ දී පොලීසිය විසින් සොයා ගන්නා ලදී. සේන තම දරුවන්ව පාසලෙන් රැගෙන යන බවත් එදිනම සවස නැවත එම දරුවන් ගෙනැවිත් බස්වන බවත් එය නිතරම සිදුවන බවටත් දෙමාපියන් විසින් පැමිණිලි කර ඇති බවට පොලීසිය ප්‍රකාශ කර තිබේ. ළමයින්ට ලිංගික අතවර කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් සේනට එරෙහිව චෝදනා ගොනු කිරීමට පොලිසිය පියවර ගනිමින් සිටී. ස්වකීය කැමැත්තෙන් තමා සමඟ එන දරුවන්ගේ ඇසුරට තමා කැමති බවට සේන තර්ක කරයි.

(ii) සේන ඉලෙක්ට්‍රොනික උපකරණ සාප්පුවකට ගොස් ජංගම දුරකථන පරීක්ෂා කරයි. එක් විකුණුම්කරුවෙකු වෙළඳසැලෙන් නව දුරකථනයක් ගෙනැවිත් එය වෙනත් පාරිභෝගිකයෙකුට පෙන්වා එය පෙට්ටියට අසුරයි. සේන හෙමිහිට පෙට්ටියක් ගෙන සාක්කුව තුළට දමා ගනී. තමා කිසිවක් මිලදී නොගත් අයුරින් සේන ගෙවුම් කවුන්ටරය පසුකර පිටතට යයි. ඔහු පිවිසුම් දොරටුව වෙත ළඟා වන විට, සීසීටීවී කැමරා දශර්න නරඹමින් සිටි ආරක්ෂක නිලධාරියා ඔහුව නවත්වා සිරුර පරීක්ෂා කරයි. දුරකථන

පෙට්ටිය ඔහුගේ සාක්කුවේ තිබී සොයාගත් නමුත් කඩිමුඩියේ සේන රැගෙන තිබෙන්නේ හිස් පෙට්ටියක් නිසා පෙට්ටිය තුළ කිසිවක් තිබුණේ නැත.

(iii) සේන රථගාලක් තුළ නවතා තිබූ මෝටර් රථයක යතුරු සිදුරකට යතුරක් ඇතුල් කිරීමට උත්සාහ කරමින් සිටියදී සොයා ගන්නා ලදී. ඔහු සැකපිට පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලබන අතර ඔහු සතුව මෝටර් රථයක් නැති නමුත් ඔහු සන්තකයේ මෝටර් රථ යතුරු කැරැල්ලක් තිබූ බව පරීක්ෂණ වලින් හෙළිවේ. මෝටර් රථයක් සොරකම් කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් ඔහු චෝදනා ලබයි.

[30 + 30 + 40 = ලකුණු 100]

2. අජිත් මුහුණු පොත මගින් අනු සමග මිතුරු විය. කිසියම් දිනක මුණගැසී විනෝද චාරිකාවක් යාම සඳහා ඔවුහු සැලසුම් කළහ. අනු ගේ ක්‍රියාකලාපය පිළිබඳ සැක කළ ඇගේ සොහොයුරා වූ අරුන් තම සොහොයුරිය ව ලුහු බැන්දේය. අජිත් සමග පිට පළාතකට යන බස් රථයක නැගීමට උත්සාහ කරන අනු දුටු අරුන් එයට බාධා කළේය. බහින්බස් වීම තුළ අරුන් අජිත්ව තල්ලු කළ විට අජිත් බිම වැටී ඔහුගේ හිස බසයේ පාපුවරුව හි ගැටිණි. අජිත්ව කඩිනමින් රෝහලට ගෙන ගොස් ප්‍රථමාධාර ලබා දී කොවිඩ් 19 සඳහා වේගවත් ප්‍රතිදේහජනක පරීක්ෂණයක් සිදු කරන ලදී. අජිත් ට කොවිඩ් රෝගය වැළඳී තිබුණ නිසා ඔහුව කොවිඩ් 19 වාට්ටුවට යවන ලද අතර එහිදී ඔහුට කොවිඩ් 19 සඳහා ප්‍රතිකාර කරන ලද අතර ඔහුගේ හිසේ තුවාල නොසලකා හැරිණි. හිසෙහි වූ තුවාල ආසාදනය වීමෙන් දින හතරකට පසු අජිත් මිය ගියේය. මේ අතර, සිද්ධිය වන අවස්ථාවේදී අරුන් තහනම් මත්ද්‍රව්‍ය භාවිතා කර සිටි බව පොලිස් පරීක්ෂණ වලින් අනාවරණය වී ඇත.

සුදුසු අධිකාරීන් ඇසුරින් අරුන්ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

[ලකුණු 100]

3. (i) ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීතිය ඇසුරින් පහත සඳහන් අවස්ථා යටතේ මහේෂ්ට ලබා ගත හැකි කිසියම් විත්තිවාචකයක් තිබේනම් සාකච්ඡා කරන්න:

(අ) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සංචරණ සීමා කර තිබූ කාලය තුළ මහේෂ් ඔහුගේ යතුරුපැදියෙන් ගමන් කරමින් සිටියදී පොලිසිය විසින් ඔහුව නැවැත්වීය. තමා පාරිභෝගිකයෙකු සඳහා ආහාර බෙදා හරිමින් සිටින බවත් පැය භාගයක් ඇතුළත ඔහුගේ ඇනවුම් ඔහුට ලබා නොදුනහොත් ඔහු ඒ පිළිබඳව තම සේවායෝජකයාට රපෝර්තු කරන බවට එම පාරිභෝගිකයා තමාට තර්ජනය කල බවත් මහේෂ් ප්‍රකාශ කළේය.

තමාගේ රැකියාව අහිමි වීම වළක්වා ගැනීම සඳහා ඔහු එම පාරිභෝගිකයාට කීකරු වූ බව මහේෂ් ප්‍රකාශ කළේය.

[ලකුණු 25]

(ආ) මධ්‍යම රාත්‍රියේ දී ශබ්දයක් ඇසීමෙන් අවදි වන මහේෂ් ඔහු සතුව ඇති විශාල විදුලි පන්දම ද රැගෙන පිටතට යයි. තමාගේ කුකුළු කූඩුව අසල නාඳුනන පුද්ගලයෙකු සිටිනු ඔහු දකී. ඔහු තම විදුලි පන්දමෙන් නාඳුනන පුද්ගලනාඳුනන පුද්ගලයාට දමා ගසන අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම පුද්ගලනාඳුනන පුද්ගලයාගේ හිස තුවාල වෙයි.

[ලකුණු 25]

(ii) ශ්‍රී ලංකාවේ ස්ත්‍රී දූෂණ නඩු වලදී අදාළ වන ‘තහවුරු කිරීම’ නම් වූ අංගය පිළිබඳව සාකච්ඡා කරන්න.

[ලකුණු 50]

4. පහත සඳහන් අවස්ථා යටතේ කමල් විසින් යම් වරදක් සිදු කර ඇත්නම් ඒවා සලකා බලන්න. සුදුසු බලධාරීන් උපුටා දක්වමින් ඔබේ පිළිතුරට ඔබ විසින් හේතු දැක්වීම අවශ්‍ය වේ:

(i) කමල් තම අසල්වැසියා ගේ නිවසෙහි පාර අද්දර පාපැදියක් තිබෙනු දකී. එය අත්හැර දමා ඇති බවට සිතන කමල් එය තම නිවසට ගෙනවිත් පාවිච්චි කරයි. ඇත්ත වශයෙන්ම එම පාපැදිය එම අසල්වැසි නිවසේ ම සුනිල් නම් වූ තැනැත්තකුට අයිති වූවක් වන අතර කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානයට කඩිනමින් යන අවස්ථාවේදී සුනිල් එය පාර අයිනේ දමා ගොස් ඇත.

(ii) කමල්ට ඔහුගේ සේවායෝජකයා විසින් මසකට රු. 50,000/- ක වැටුපක් ගෙවනු ලබන අතර එය සෑම මසකම අවසාන දිනයේදී ඔහුගේ බැංකු ගිණුමට බැර කෙරේ. සැප්තැම්බර් 30 වැනිදා රු. 60,000/- ඔහුගේ බැංකු ගිණුමට බැර කර ඇත්තේ ඔහුගේ සේවායෝජකයාගේ ගණකාධිකාරීවරයාගේ වරදක් නිසාය. කමල් මුළු මුදලම වියදම් කරයි.

(iii) කමල්, සුමතිට දුරකථන ඇමතුමක් ලබා දී සුමති පිරිමි ළමයෙකු සමඟ සිටින ඡායාරූපයක් ඇගේ දෙමාපියන්ට ඉදිරිපත් කිරීම නැවැත්වීම සඳහා ලක්ෂ පහක් තමාට ගෙවන ලෙස ඉල්ලා සිටියේය. සුමති ලක්ෂ පහක වටිනාකමින් යුත් ආභරණ කමල් ට ලබා දෙන අතර ඇගේ සියලු ඡායාරූප කමල්ගේ දුරකථනයෙන් මකා දමන ලෙස ඉල්ලා සිටියාය. කමල් එය ප්‍රතික්ෂේප කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බහින් බස්වීමක් ඇති විය. කමල් සුමතිගේ ගෙල මිරිකා ඇය ඉවතට තල්ලු කර එම ස්ථානයෙන් පලා ගියේය.

(iv) කමල් Hp සන්නාමයේ මුල් පරිගණක පහක් සහ අඩු ගුණාත්මක පරිගණක පහක් මිලදී ගත්තේය. ඔහු පෙට්ටියෙන් මුල් පරිගණක පිටතට ගෙන අඩු ගුණාත්මක පරිගණක Hp පෙට්ටිය තුළ බහා ඒවා මුල් පරිගණක වල මිලටම සුදත්ට විකුණුවේය.

[25 X 4 = ලකුණු 100]

5. යථාර් ත වගකීම නම් මූලධමර්ය පිළිගැනීම අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ අසාධාරණයෙහි උච්චතම අවස්ථාවයි. ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ශ්‍රී ලංකාවේ සහ එංගලන්තයේ ඇති ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

[ලකුණු 100]

6. මත්පැන් පානය නොකරන කෙනෙකු වූ විජයට ඔහුගේ මිතුරන් විසින් නගරයේ සමාජ ශාලාවක සාදයකට ආරාධනා කරන ලදී. විජය සැහැල්ලු මධ්‍යසාර පානයක් ඇණවුම් කළේය. විජය සැර මත්පැන් නොබොන බව දන්නා ඔහුගේ මිතුරන් හිතාමතාම විජයගේ පානයට සැර මත්පැන් මිශ්‍ර කළහ. විජය එම පානයේම තුන්වන වීදුරුව පානය කරමින් සිටියදී, සමාජ ශාලාවේ සිටි තවත් පාරිභෝගිකයෙකු අතින් වැරදීමකින් විජය ගේ කමිසය මත බීම වගර්යක් ඉහිරුණු අතර ඔහු විජයට කෑගසන්නට විය. කෝපයට පත් විජය එම පුද්ගලයාට එහි තිබූ පා පුටුවකින් පහර දුන් අතර එමඟින් ඔහු දැඩි ලෙස තුවාල ලැබීය. පහර දීමෙන් සිදු වූ තුවාල හේතුවෙන් එම පුද්ගලයාගේ හිසට ශල්‍යකමර්යක් කිරීමට සිදු විය. රාජකාරියේ යෙදී සිටි වේටර් වරයකු ගුටිබැට හුවමාරුව නැවැත්වීමට පැමිණි අතර විජය ඔහුව තල්ලු කළේය.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අදාළ ප්‍රතිපාදන සහ තීන්දු වූ නඩු ඇසුරින් විජයගේ අපරාධ වගකීම සාකච්ඡා කරන්න.

[ලකුණු 100]

--------